# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/4 - 2020 පෙබරවාරි මස 17 වැනි සඳුදා - 2020.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: GA/IMA/LAN/05/02/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අටානිකිත ග්‍රාම නිලධාරි වසමේ අටානිකිත ගමේ මැනුම් අධිකාරි විසින් පිළියෙල කොට ඇති අංක මු. පි. ගා. 4286 සහ 2019.12.05 දිනැති අවසාන ගම් පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 2.0047ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

**කැබලි අක්ෂරය 01 - *ඉඳුරෙඹවිල හෙවත් ඉඳුරෙගොඩ* (හැමිටන් සුනාමි ගම) - ප්‍රමාණය : හෙක්. 2.0047ක් පමණ**

**මුල් ඉඩමට හිමිකම් පාන්නේ : උපාලි වික්‍රමසේකර මයා, චෙරි වික්‍රමසේකර මිය, ලයනල් උපාලි ද සිල්වා මයා, කුසුම් ද සිල්වා මිය, රෙජිනෝල්ඩ් අබේවීර මයා.**

*උතුරට* : ගා 3604 වැනි මූලික පිඹුරේ කැබලි අංක 3, 2, ගා. 2537 වැනි මූලික පිඹුරේ කැබලි අංක 27, 26, 25 සහ ඉඳුනිල් පුර සුනාමි ගම්මානය.

*නැගෙනහිරට* : ඉඳුනිල්පුර සුනාමි ගම්මානය, මාර්ග (මා. සං. අ.) සහ අටානිකිත ප්‍රජා සංවර්ධන පුහුණු හා පර්යේෂණායතනය ;

*දකුණට*: අටානිකිත ප්‍රජා සංවර්ධන පුහුණු හා පර්යේෂණායතනය, ගා 2542 වැනි මූලික පිඹුරේ කැබලි අංක 31 හා 3604 වැනි මූලික පිඹුරේ කැබලි අංක 11, 3, 9, 8 සහ 3;

*බටහිරට*: ගා 2542 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1, ගා. 3604 වැනි මූලික පිඹුරේ කැබලි අංක 11, 3, 9, 8, 3, 2 හා 2537 වැනි මූලික පිඹුරේ කැබලි අංක 27, 26 හා 25.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 මාර්තු මස 10 වැනි දින පෙ. ව. 10.00 ට ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 පෙබරවාරි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. ජී. ලක්ෂ්මී කාන්ති,
ප්‍රාදේශීය ලේකම්,
ඉමදූව.

2020 පෙබරවාරි මස 12 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03- 05

1A - G 32048 – 11 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.